කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

**GENERAL WEATHER FORECAST FOR SRI LANKA**

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**2022 දෙසැම්බර් මස 09 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2022 දෙසැම්බර් මස 08 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ (ත්‍රිකුණාමලය සිට කි.මී. 300ක් පමණ ඊසාන දෙසින්) ස්ථාපිත වී පවතින "මැන්ඩවුස්" සුළි කුණාටුව පෙ.ව. 08.30 වන විට අක්ෂාංශ 9.5N සහ දේශාංශ 83.8E ආසන්නයේ ස්ථානගතව පැවතුනි. මෙම පද්ධතිය බටහිරට බරව වයඹ දෙසට ගමන් කර දෙසැම්බර් 09 රාත්‍රී කාලය වන විට නිරිත දිග බෙංගාල බොක්ක හරහා උතුරු තමිල්නාඩු, පුදුචේරි සහ දකුණු ආන්ද්‍ර ප්‍රදේශ් වෙරළ තීරය හරහා ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**

දිවයිනේ බොහෝ ප්‍රදේශවල අහස වලාකුලින් බරව පවතී.

උතුරු පළාතේ නිරන්තර වැසි ඇති වන අතර ඇතැම් ස්ථාන වලට මි. මි. 100 ට වැඩි තද වැසි ඇතිවිය හැක.

සබරගමුව පළාතේ සහ ගාල්ල, මාතර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක වල විටින් විට වැසි ඇති වේ.

බස්නාහිර සහ වයඹ පළාත් වලත්, නුවර එළිය සහ මහනුවර දිස්ත්‍රික්කවලත් වැසි වාර කිහිපයක් ඇති විය හැක.

උතුරු, උතුරු-මැද, නැගෙනහිර, ඌව, සහ මධ්‍යම පළාත්වල විටින් විට හමන පැ.කි.මී. (60-70) පමණ තද සුළං බලාපොරොත්තු වේ.

**WEATHER FORECAST FOR 09 DECEMBER 2022**
**Issued at 1200 noon on 08 December 2022**

**The cyclonic storm "Mandous" over Southwest Bay of Bengal (300km north-east of Trincomalee) located near latitude 9.5N and longitude 83.8E at 08.30am today. It is very likely to move west-northwestwards and cross North Tamil-Nadu, Puducherry and South Andhra Pradesh coast over Southwest Bay of Bengal around mid-night of 09$^{th}$ December.**

Cloudy skies will prevail over most parts of the Island.

Intermittent showers are expected in the Northern Province with heavy rainfall exceeding 100mm at some places.

Showers will occur at times in the Sabaragamuwa Province and Galle, Matara and Trincomalee districts.

Several spells of showers may occur in the Western and North-Western Provinces and Nuwara-Eliya and Kandy districts.

Strong winds about (60-70) kmph can be expected at times over the Northern, North-Central, Eastern, Uva & Central provinces.

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2022 දෙසැම්බර් මස 08 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ (ත්‍රිකුණාමලය සිට කි.මී. 300ක් පමණ ඊසාන දෙසින්) ස්ථාපිත වී පවතින "මැන්ඩවුස්" සුළි කුණාටුව පෙ.ව. 08.30 වන විට අක්ෂාංශ 9.5N සහ දේශාංශ 83.8E ආසන්නයේ ස්ථානගතව පැවතුනි. මෙම පද්ධතිය බටහිරට බරව වයඹ දෙසට ගමන් කර දෙසැම්බර් 09 රාත්‍රී කාලය වන විට නිරිත දිග බෙංගාල බොක්ක හරහා උතුරු තමිල්නාඩු, පුදුචේරි සහ දකුණු ආන්ද්‍ර ප්‍රදේශ් වෙරළ තීරය හරහා ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**

**එම පද්ධතියේ බලපෑමෙන් දෙසැම්බර් 08 සහ 09 යන දින වලදී දිවයිනට උතුරු සහ නැගෙනහිර දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල විටින් විට ඉතා තද සුළං සමග තද වැසි ඇති විය හැකි අතර එම මුහුදු ප්‍රදේශ ඉතා රළු සහ විටින් විට දළ රළු විය හැක.**

**කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකළපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස (මීටර්. 2.5 – 3.5 ක් පමණ) ඉහළ යාමේ හැකියාවක් ද පවතී.**

**මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකළපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වලට සහ නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ වලට නැවත දැනුම්දෙන තෙක් යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකළපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං උතුර සිට වයඹ දක්වා වන දිශා වලින් හමා එයි.
කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ වල සුළඟේ වේගය පැ.කි.මී. (40-50) පමණ වන අතර විටින් විට පැ.කි.මී. (65-75) පමණ දක්වා වැඩි විය හැක. දිවයින වටා වන අනෙකුත් මුහුදු ප්‍රදේශ වල සුළඟේ වේගය පැ.කි.මී. (30-40) පමණ වන අතර විටින් විට පැ.කි.මී. (50-60) පමණ දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ ඉතා රළු සහ විටින් විට දළ රළු විය හැක . දිවයින වටා වන අනෙකුත් මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 1200 noon on 08 December 2022**

**The cyclonic storm "Mandous" over Southwest Bay of Bengal (300km north-east of Trincomalee) located near latitude 9.5N and longitude 83.8E at 08.30am today. It is very likely to move west-northwestwards and cross North Tamil-Nadu, Puducherry and South Andhra Pradesh coast over Southwest Bay of Bengal around mid-night of 09th December.**

**Under the influence of this system, the deep and shallow sea areas of northern and eastern coast will be very rough to high with very strong gusty winds and heavy rain during 08 and 09 of December.**

**There is a possibility to increase swell waves (about 2.5 – 3.5 m) in the sea areas off the coast extending from Kankasanturai to Pottuvil via Trincomalee & Batticaloa.**

**Naval and fishing communities are advised not to venture into the deep and shallow sea areas off the coast extending from Mannar to Pottuvil via Kankasanturai, Trincomalee & Batticaloa and Southwest Bay of Bengal until further notice.**

**Fishing and naval community are requested to be attentive to future forecasts issued by the Department of Meteorology in this regard.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas off the coast extending from Kankasanturai to Pottuvil via Trincomalee and Batticaloa.

**Winds:**

Winds will be northerly to north-westerly. Wind speed will be (40-50) kmph and gusting up to (65-75) kmph at times over the sea area extending from Kankasanturai to Pottuvil via Trincomalee & Batticaloa. Wind speed will be (30-40) kmph and gusting up to (50-60) kmph at times in the other sea areas around the island.

**State of Sea:**

The sea areas off the coast extending from Kankasanturai to Pottuvil via Trincomalee & Batticaloa will be very rough and high at times. Other sea areas around the island will be rough at times.